# <u>උයනෙහි සැඟව ගිය දිය කඩතුරාව</u>



තිසා වැව් කණ්ඩියට පහළින් නැගෙනහිර බිම් තිරුවෙහි ඉසුරු මුනි විහාරයට මායිම්ව පිහිටි ස්වභාවික පර්වත කීපය උපයෝගී කරගනිමින් අක්කර 40ක පමණ පටු භූමියෙහි ඉදිකරනු ලැබූ රාජකීය ජල උද්‍යානය වෙස්සගිරි පර්වත පංතියෙන් උතුරට වන්නට පිහිටා තිබේ. නෙළුම් පත්‍ර වලින් ගහණවූ පොකුණක දිය කෙළින ඇත් රූ සමූහයක් සහිත වූ කලාත්මක අතින් පිරිපුන් පල්ලව කලා ලක්ෂණ හා සම්මිශ්‍රනය වූ ස්වදේශීය නිර්මාණාත්මක කෞෂල්‍ය ඉස්මතු කෙරෙන කුඩා පොකුණු තුනකින් සමන්විත රන්මසු උයන , අනුරාධපුර යුගයේ නිර්මාණය කරනු ලැබූ උසස් වාස්තු ලක්ෂණ විදහාපාන ඉදිකිරීමක් ලෙස හඳුන්වා දිය හැකි වේ. අනුරාධපුර මුල්අවධියේදීම මෙම උද්‍යානය යම්කිසි ලෞකික අරමුණක් උදෙසා ඉදිකොට පසුව රාජධානිය අතහැර යාමත් සමගම භාවිතයෙනතොර වීම හේතුවෙන් නටබුන් වී යන්නට ඇතයි අනුමාන කළ හැකි වේ. මහාමේඝ උයන, ජෝතිවන උයන , නන්දන උයන ආදී රාජකීය උද්‍යානයන් ආගමික කටයුතු සඳහා යොදා ගැනීම හේතුවෙන් වසභ රාජ සමයේ දී ඉදිකරන්නට ඇතැයි සැළකන මෙම ශිලා උද්‍යානය ද පසු කාලීනව ඉසුරුමුනි විහාරයෙහි වාසය කල භික්ෂූන් විසින් ප්‍රයෝජනයට ගනු ලබන්නට ඇත.

ඉසුරුමුනි විහාරයෙහි පොකුණෙහි දිය කෙළින ඇතුන් හා රාජකීය ජලෝද්‍යානයෙහි දක්නට ලැබෙන ඇත් රූප අතර එක් තේමාවක් දක්නට ලැබෙනමුත් කැටයම් ශෛලියෙහි කිසියම්වූ වෙනස්කම් දක්නට හැකි වේ. කොරවක් ගලෙහි හා විහාරයෙහි ඇති පොකණෙහි තුම්පත් රැන දැක්වීම කලාත්මක ලෙස සිදුකොට තිබේ. එහි ඇත ත්‍රිමාණශීලී ස්වරූපය අනෙක් ඇත් රූපයෙහි දක්නට නොාමැත. රන්මසු උයනෙහි ඇත්රූප කෙළි ලොල් බවින් හා ලයාන්විත බවින් පිරී තිබේ. නිර්මාණ කරුවන් කිහිපදෙනෙකු විසින් සිදු කරන්නට ඇතැයි අපේක්ෂා කල හැකි මෙහි, විහාරයෙහි කැටයම් අතර අවකාශය පිරවීම සඳහා නෙළුම් පත්‍ර යොදාගෙන නොමැත. පල්ලව කැටයම් අතර දක්නට ඇති 'අර්ජුනගේ ශාපය' නම් දැවැන්ත කැටයමෙහි යොදා ඇති ඇත් රූප දෙක හේතුවෙන් ඉසුරුමුනි කැටයම් පල්ලව ආභාෂය ගෙන ඇතැයි විද්වතුන් දක්වා ඇතත් සමකාලීනව හමුවී ඇති දේශීය කැටයම් වලට අමතරව මහ වැලි ගෙහහි කටුපිල්ලෙහි දක්නට ඇති ඇත් රූපය හා සැසඳීමේදී මේ සඳහා දේශීය ශිල්පීන් සතු පැවති නිර්මාණාත්මක ප්‍රාගුණ්‍යය මැනවින් ඉස්මතු වී පෙනේ.

තිසා වැවේ ජලය නල මාර්ග ඔස්සේ උද්‍යානය වෙත ගෙන ගොස් එම ජලයෙන් මෙම පොකුණු වලට ජලය ලබා දුන් අතර අපිරිසිදු ජලය ඉවත් කිරීම හාජලක්‍රීඩා ආදියට යෝග්‍ය වන අන්දමින් ජලය නිරන්තරවම බැස යන ආකාරයෙන් ශිල්පීය උපක්‍රමයක් යොදා ගැනීම මෙම උද්‍යානයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වේ.

තිසා වැව් කණ්ඩියෙන් පහළ පිහිටීම හේතුවෙන් සොබාවිකවම ජලයේ ඇති වන පීඩනය හා නිරන්තරවම රළ පහරේ ඇති කරන බලය මගින් මෙම කැටයම් සහිත පොකුණෙහි ඉදි කොට ඇති දැනට ක්‍රියාත්මක නොවන ජල කඩතුරාවන් ක්‍රියාත්මක වූ අතර ආසනයක් සහිත ශිලා කුටියෙහි දොරටුව එමගින් ආවරණය වන්නට ඇතැයි සලකනු ලැබේ. මැටි නල මාර්ග ඔස්සේ නිර්මාණය කර තිබූ උමං ජල මාතිකා වර්තමානය වන විට අක්‍රීය තත්වයේ පවතිනු දැකිය හැකිය. අනෙක් විශාල පොකුණෙහි ඉදිකොට ඇති කුටි කීපය වස්ත්‍ර මාරුකර ගැනීමට යොදාගනු ලැබූ අතර මෙහි පියස්සේ ඇති සිදුරු තුළින් නිරන්තරවම දිය පහළට ඇදහැලෙන්නට ඇතැයි පේක්ෂා කලහැකි වේ. ප්‍රමායෙන් කුඩා පොකුණු තුළ බැස විඩාව සන්සිඳුවීමත්, දාහය නිවාගැනීමත්, රමණය කිරීමත්, ස්නානය කිරීමටත් හැරෙන්නට පිහිනීමට හෝ ක්‍රියාශීලී ජල ක්‍රීඩාවන්හි යෙදීමට තරම් ප්‍රමාණවත් ඉඩ පහසුකම් මෙහි දක්නට නොලැබේ ජල මට්ටම් කීපයකින් නිර්මාණය වී ඇති පොකුණු මායිමෙහි සුව පහසු ආකාරයෙන් හිඳ දෙපා ජලයෙහි ගිල්වා ක්‍රීඩා කිරීමටත් අභ්‍යන්තර කොටසෙහි ජල කෙළියෙහි යෙදෙනවුන් දෙස බලා විනෝදාස්වාදයක් ලැබීමටත් හැකි වන ආකාරයෙන් පොකුණු නිර්මාණය වී තිබේ. මේ හේතු නිසාවෙන් රාජකීයයන් පමණක් මෙහි ප්‍රයොජනය ලබන්නට ඇතැයි වි ශ්වාස කල හැකිය. ප්‍රමානයෙන් තරමක් විශාල ද්විත්ව පොකුණෙහි කඩතරාවෙන් වැටෙන ජලයෙන් පිරී ඉතිරී යන ජලයෙන් දෙවනි පොකුණ පිරීම ආරම්භ වන අතර එය ගැඹුරින් අඩුය. ඇදහැලෙන ජලය හේතුවෙන් පරිසයෙහි සිසිල් බවත් අලංකාරත්වයත් මෙන්ම පිරිසිදු බවත් වැඩිවේ. පළමු පොකුණෙහි ගබඩා ජලය දෙවන පොකුණෙහි ප්‍රමාණයන් පහසුවෙන් පාලනය කළ හැකි වේ. ගලෙහි පිහිටීම හොඳින් අධ්‍යනයට ලක් කොට ඉදිකරනු ලැබූ මෙම නිර්මාණය කුට්ටම් පොකුණ හා පොළොන්නරුවේ කුමාර පොකුණ යන පොකුණ දෙකෙහිම දක්නට ඇති වාස්තු හා ශිල්පී ය ලක්ෂණ කැටි වූ නිර්මාණ කරණයකි. ඉසුරුමුනි විහාරයෙහි පිහිටා ඇති ඇත් රූප හා ජල තටාකය ද රන්මසු උයනෙහි නර්මාණ ශිල්පීන් විසින්ම ඉදිකරන්නට ඇති බව අනුමාන කල හැකිය. රන්මසු උයනෙන් නිකුත් වන අතිරික්ත ජලය මෙම පොකුණට ලබා දෙනු ලැබූ අතර ඉන් පිට වන ජලය පහළින් පිහිටි පහත්බිම් කරා යොමු කර තිබේ. මිහින්තලයෙන් හමුවී ඇති මුඛයෙන් ජලය

නිකුත් කරන සිංහ රූපයත් සොරබොර වැවේ සොරොව්ව හා සීගිරි ජල මල් ආදී නිර්මාණයෝ ද ලාංකේය වාරි ශිල්පියාගේ කෞෂල්‍යයන් මොනවට ඉස්මතු කරවන කර්මාන්තයයෝ වෙති.

මෙම ශිල්පීය ඥානය සමකාලීනව ඉදිකරනු ලැබූ සීගිරි ජල උද්‍යානය සැළසුම්කරණය බෙහෙවින් උපකාර වන්නට ඇතැයි අනුමාන කල හැකිය. ඒ අනුව සමකාලීන වශයෙන් මෙම යුගයේ සිටි ශිල්පීන් සතුව පැවති ජලය නිර්මාණාත්මකව හැසිරවීමේ ඉංජිනේරු තාක්‍ෂණය හා ක්‍ෂුද්‍ර ජල සම්පාදන හැකියාව ලෝකයම මවිත කරවන සුලූ වේ.



රාජකීය උත්සව, අභිෂේක මංගල්‍යන් හා ආගමික චාරිත්‍ර වලදි තිසා වැවෙහි ශුද්ධ ජලය යොදාගැනීම අනුරාධපුර යුගයේ බොහෝ සේ අසන්නට ලැබෙන කරුණකි. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට තිසා වැව් දියෙන් බොහෝ පූජාවන් සිදු කල බව බෝධිවංශයේ ද සඳහන්කර තිබේ. තිසා වැව් දියෙන් රත්නමාලී චෛත්‍යයේ අතුරනු ලැබූ පිච්ච මල් සඳහා යන්ත්‍රානුසාරයෙන් දියබිඉ සිනු ලැබූ බව ථූපවංශෙයෙහි ද සඳහන් කර තිබේ. සද්ධර්මාලංකාරයෙහි කාකවර්ණ වස්තුවෙහි දක්වා ඇති අන්දමට විහාර මහා දේවියට උපන් දොළ සන්සිදුවීමට වේළුසුමන යෝධයා තිසා වැවෙන් පැන් කලයක් ගෙනා බවද කියවේ. මෙම කතාවෙහි එන සාලිරාජ වස්තුවෙහි සඳහන් වන ආකාරයට එකල බස්නාහිර වීථියේ තිබූ යුවරජ මාළිගයේ සිට උයන් කෙළි පිණිස නිරන්තරවම සාලිය යුවරජු රන්මසු උයනට පැමිණි බවත් එම අවස්තාවක දී උයනේ තිබූ හෝපලු ගසක මල් නෙලමින් සිටි හෙල්ලෝලී නම් චණ්ඩාල ගම් නායකයාගේ දියණිය වූ දේවි හෙවත් අසෝකමාලා මුණ ගැසුනු බවත් අනතුරුව සාලිය අසෝකමාලා පෙම් වෘත්තාන්තය ආරම්භ වූ බවත් සඳහන්ය.

මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ගේ මතය අනුව ජනප්‍රවාද වල සඳහන් වන සාලිය අසෝකමාලා ප්‍රේම වෘත්තාන්තයට පාදක වූ ප්‍රෙදේශය මෙය වන්නට ඇතැයි යන මතයෙ බොහෝ දෙනා අතර තදින් කා වැදී ඇති අතර මේ හේතුව නිසාවෙන් 1940 දී පමණ සිදුකරනු ලැබූ පුරාවිද්‍යා සංරක්‍ෂණ කටයුතු වල දී රෝපණය කරනු ලැබූ අසෝක ගස් කිහිපය මලින් බරව මෑතක් වන තුරුත් උද්‍යානය තුළ ශේෂ වී දක්නට ලැබිණි. වර්තමානය වන විට මෙම බොහෝමයක් ශාක මිය ගොස් ශුෂ්ක පරිසරයක් බවට පරිවර්තනය වී තිබේ. සාහිත්‍යයේ වැදගත් සංධිස්ථානයක් ලෙස සළකනු ලැබූ ඉසුරුමුණි විහාරයත් රන්මසු උයනත් තිසා වැවත් සබන්ධයෙන් බැඳුණු ඓතිහාසික බැඳීම වෙන් වෙන් වශයෙන් විග්‍රහ නොකළ යුතු වන්නා සේම මෙම නටබුන් පරිශ්‍රයෙන් හමු වූ ලෝකප්‍රක රජ පවුල, පෙම් යුවල, මිනිසා සහ අශ්ව හිස යන කැටයම් වලින් ද මෙම නිගමනය සනාථ කළ හැකි වේ.

බොහෝ දෙනෙකුගේ අවධානයෙන් ගිලිහී ගිය රන්මසු උයනෙහි පිහිටි පර්වත මුණතක කොටා ඇති ඉපැරණි සක්වල චක්‍රයත් මෙම භූමියෙහි එක් පසකට වන්නට ඉදිකොට ඇති අටපට්ටම් හැඩැති ගොඩනැගිල්ලෙහි ටබුන් කීපයක් ද ශේෂ වී ඇති මුත් ඒ පිළිබඳව කිසිවකුගේ අවධානයක් යොමු වී නොමැති වීම කණගාටුදායක තත්වයකි. අවම වශයෙන් නියඟයෙන් ඉරිතැලී මෝසම් වැස්සෙන් පිරීයන පොකුණු වල ඇති වාරි තාක්‍ෂණය නැවතත් ක්‍රියාත්මක කල හැකි ආකාරයෙන් සකස් කල හැකිනම් සීගිරියෙහි ඇති ජලමල් මෙන්ම රන්මසු උයනෙහි ඇති දිය කඩතුරාවන් ද සංචාරකයින් ඉසුරුමුනි විහාරය වෙත ඇදගනු නොඅනුමානය.

(ඩබ්.ඒ. ගිහාන් කල්‍යාන)